# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2013/14**
**2017 අප්‍රේල් - ජූනි**
**මානවශාස්ත්‍ර පීඨය**

**නාට්‍ය හා රංගකලාව - DMAT – E 2015**

**අපරදිග නාට්‍ය හා රංග කලාව**

**ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. සමකාලීන ග්‍රීසියේ පැවති සාමාජීය, සංස්කෘතික හා බුද්ධි විෂයික පරිසරය ග්‍රීක නාට්‍ය කලාවේ තේමාවන් හා ආකෘතීන් සකස්වීමට උපස්ථම්භක විය. නිදසුන් සහිතව විමසන්න.

02. හොඳ හා නරක අතර ගැටුමකින් නොව, හොඳ හා හොඳ අතර ඝට්ටනයෙන් ට්‍රැජඩි වීරයා ඛේදයට පත්වේ. **"ඊඩිපස් රජ"** ඇසුරින් විමසන්න.

03. රෝම රංගභූමිය විස්තර කොට එය රෝම නාට්‍ය විකාශනයෙහිලා කොතෙක්දුරට බලපා ඇත්දැයි නිදසුන් සහිතව පෙන්වා දෙන්න.

04. ටෙරන්ස්, ප්ලෝටස් හා සෙනෙකාගේ නාට්‍ය භාවිතයේ සුවිශේෂිතා පිළිබඳ විමසීමක් කරන්න.

05. මධ්‍යකාලීන යුගයේ ආගමික නාට්‍ය වන මිරැකල්, මිස්ටරි, මොරැලිටි අතර සුවිශේෂිතා සංසන්දනාත්මකව විමසන්න.

06. **EVERYMAN** නාට්‍ය සෙසු මධ්‍යකාලීන නාට්‍ය අභිභවා සිටින්නේ උපදේශ නාට්‍යයක ලක්ෂණ ඉක්මවා නාට්‍යමය ගුණය ප්‍රබලව මතුවන බැවිනි. සාකච්ඡා කරන්න.

07. ෂේක්ස්පියර්ගේ **ට්‍රැජඩි නාට්‍ය** ගැඹුරු තේමාවන් ප්‍රස්තුත කරගන්නා අතර **කොමඩි නාට්‍ය** සැහැල්ලු විචිත්‍ර සංකල්පනයන් මත පදනම් වී ඇත. නිදසුන් සහිතව විමසන්න.

08. "**HAMLET** නාට්‍යයේ ඛේදාන්තය හැම්ලට් චරිතයට පමණක් සීමා වූවක් නොවේ." මෙම අදහස සමඟ ඔබට එකඟ විය හැකිද? නොහැකිද? විමසන්න.

09. පහත සඳහන් නාට්‍යකරුවන් අතරින් දෙදෙනෙකුගේ නාට්‍ය භාවිතය පිළිබඳ විමසීමක් කරන්න.

    1. ඊස්කිලස්     2. යූරිපිඩීස්
    3. බෙන් ජොන්සන්     4. මොලියර්

10. ප්‍රංශයේ නව සම්භාව්‍යවාදී නාට්‍ය වර්ධනයට **කෝනෙල්** හා **රසීන්** දෙදෙනා කළ මෙහෙය විමසන්න.

**********************